කෘෂිකර්ම අමාත්‍යාංශය

කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සඳහා වන අහිතකර බලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය

# වැව් කරවල සහ දුම් කරවල

## ගෙදර හදමු සල්ලි හොයමු











සහයෝගය

ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය

# වැව් කරවල නිෂ්පාදනය

## අවශ්‍ය ද්‍රව්‍ය



අලුත් මාළු



කුළුබඩු (අවශ්‍ය නම් )



සාමාන්‍ය ලුණු (ආහාරයට ගත හැකි)

### පියවර 01

ශුද්ධ කිරීම.
මත්ස්‍යාගේ කොරපොතු වරල් බොකු
බඩවැල් හා කරමල් ඉවත් කරනු ලැබේ.
(කුඩා ප්‍රභේද වල හැර)

### පියවර 02

සේදීම,
ශුද්ධ කල මසුන් පිරිසිදු ජලයෙන් හොදින්
සේදිය යුතුය. මෙහිදී 5% - 10% ලුණු වතුරෙන්
සේදීම ඉතා සුදුසුවේ.

### පියවර 03

තීරු ගැසීම, පැලීම, පිලට් කිරීම, පෙති
ගැසීම.

### පියවර 04

ලුණු දැමීම හා විරාමය,
සංතෘප්ත ලුණු ද්‍රාවණයේ ගිල්වීම - 36%
ලුණු ද්‍රාවණයේ ගිල්විම හෝ ලුණු ගැල්වීම.

### පියවර 05

වැඩි ලුණු සේදීම.

### පියවර 06

වතුර ඉවත්වනතුරු වියළීම.



| මත්ස්‍ය කාණ්ඩය | සංතෘප්ත ලුණු ද්‍රාවණයේ ගිල්වීම | ලුණු ගැල්වීම |
|---|---|---|
| මි.මි. 200 ට වැඩි | පදම් කිරීමේ කාලය පැය 12 | මාළු ලුණු අනුපාතය 3-4 :1<br>පදම් කිරීමේ කාලය පැය 12 |
| 120 සිට මි.මි. 200 දක්වා | පදම් කිරීමේ කාලය පැය 6-12 | මාළු ලුණු අනුපාතය 4-5 : 1<br>පදම් කිරීමේ කාලය පැය 12 |
| 120 ට අඩු | | මාළු ලුණු අනුපාතය 5-6 : 1<br>2% - 10% (බර/බර)<br>පදම් කිරීමේ කාලය පැය 6-12 |

## වැව් කරවල සෑදීම



## ආදායම් වියදම් ඇස්තමේන්තුව වැව් කරවල කි.ග්‍රෑ 01 නිපදවීමට

| | |
|---|---|
| මාළු කාප් මසුන් කි.ග්‍රෑ 03 | රුපියල් 900.00 |
| සාමාන්‍ය ලුණු | රුපියල් 200.00 |
| වෙනත් | රුපියල් 100.00 |
| මුළු වියදම | රුපියල් 1200.00 |
| කරවල කි.ග්‍රෑ 01 අලෙවි කරන මිල | රුපියල් 1500-1700 |

## ආදායම් වියදම් ඇස්තමේන්තුව දුම් කරවල කි.ග්‍රෑ 01 නිපදවීමට

| | |
|---|---|
| මාළු කාප් මසුන් කි.ග්‍රෑ 05 | රුපියල් 1500.00 |
| සාමාන්‍ය ලුණු | රුපියල් 250.00 |
| වෙනත් | රුපියල් 100.00 |
| මුළු වියදම | රුපියල් 1850.00 |
| කරවල කි.ග්‍රෑ 01 අලෙවි කරන මිල | රුපියල් 2500.00 |

## SARP ව්‍යාපෘතියේ සම්බන්ධීකරණ තොරතුරු


**කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සඳහා වන අහිතකර බලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය**

**ව්‍යාපෘති කාර්යාලය**

අංක 2/2/1, කන්දවත්ත පාර,
පැලවත්ත, බත්තරමුල්ල

info@sarp.lk

+9411-2770986

www.sarp.lk

**නිකවැරටිය උප කාර්යාලය**
ගොවිජන පුහුණු ආයතනය,
නිකවැරටිය
+9477-3994789
sarp.hub1@gmail.com

**මැදවච්චිය උප කාර්යාලය**
අංක 554, කටුවෙල පාර, මැදවච්චිය
+94252228700
sarp.hub2@gmail.com

# දුම් කරවල නිෂ්පාදනය



සාමාන්‍ය ලුණු (ආහාරයට ගතහැකි)

## අවශ්‍ය ද්‍රව්‍ය



අලුත් මාළු

## 1 පියවර

ශුද්ධ කිරීම.
මත්ස්‍යාගේ කොරපොතු වරල්,
බොකු ,
බඩවැල් හා කරමල් ඉවත් කරනු
ලැබේ.

## 2 පියවර

ශුද්ධ කල මසුන් පිරිසිදු ජලයෙන්
හොදින් සේදිය
යුතුය.

## 3 පියවර

තීරූ ගැසීම, පැලීම, පිලට් කිරීම,
පෙති ගැසීම.

## 4 පියවර

ලුණු දැමීම හා විරාමය,
1 සංතෘප්ත ලුණු ද්‍රාවණයේ ගිල්වීම. -
36% ලුණු ද්‍රාවණයේ ගිල්වීම
ලුණු දැමීමේදී මිනිත්තු 20-30 තැබීම.

## 5 පියවර

සේදීම

## 6 පියවර

වේලීම

## 7 පියවර

දුම් ගැස්සවීම

## දුම් ගැසීම සදහා භාවිතයට සුදුසු දැව වර්ග

■ තද දැවයක් ඇති පුළුල් පත්‍ර සහිත ගස් වලින් ලබා ගන්නා දැව සුදුසුය.

■ දුම්මල, ලාටු, ඉටි හා සැර සුවඳ සහිත දැව සුදුසු නොවේ.

■ පදම් කල දැව, තීන්ත ආලේප කල දැව සුදුසු නොවේ.

■ සුදුසු දැව වල ලීකුඩු, යතු රොඩු සුදුසුය.

■ කුරුඳු, අඹ, කොස්, වීර, පොල් අතු සුදුසු වන අතර පොල් ලෙලි හා තල් සුදුසු නැත.

## ඉතා රසවත් සෞඛ්‍ය ආරක්ෂිත නිෂ්පාදන ලබාගැනීමේදී වැදගත් කරුණු

- දුම් ගසන කාලය අඩුකිරීම.
- දුම්ගැසූ මාළු මත තාර තැන්පත් වීම වළක්වා ගැනීම.
- දුම් ජනකයේ උෂ්ණත්වය 350⁰C -400⁰C අතර පවත්වා ගැනීම.